2019/04

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 2019-01-28

පැමිණිලිකරු : යූ.එස්.එස්.කේ. රොඩ්‍රිගෝ මහතා.
අංක : 153, දුම්රිය මාවත,
පන්සල පාර, මහරගම.

වින්දිත පාර්ශවය : යූ.ආර්.වයි රොඩ්‍රිගෝ මයා

වගඋත්තරකරුවන් : 01. සභාපති,
සිලෝන් පෙට්‍රෝලියම් ස්ටොරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්,
තිමාව, කොලොන්නාව.

02. කළමණාකාර අධ්‍යක්ෂක,
සිලෝන් පෙට්‍රෝලියම් ස්ටොරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්,
තිමාව, කොලොන්නාව.

03. මානව සම්පත් කළමනාකරු,
සිලෝන් පෙට්‍රෝලියම් ස්ටොරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්,
තිමාව, කොලොන්නාව.

*පැමිණිලි අංකය : HRC/1576/16*

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටොරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතන විසින් පැවති ඇබෑර්තු 174 ක් සඳහා සුදුසු අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවා පත්වීම් ලබාදීමට අදාළව පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ වලදී සහ පසුව සුදුසු අයදුම්කරුවන් තෝරා පත් කර ගැනීමේ දී වගඋත්තරකරුවන් විසින් ගන්නා ලද විවිධ තීරණ හා තීන්දු හේතුවෙන් පැමිණිලිකරුගේ පුතා වන යූ.ආර්.වයි රොඩ්‍රිගෝ යන අයගේ මූලික අයිතිවාසිකම් කඩ වූ බවට සඳහන් කරමින් මෙම පැමිණිලිකරු විසින් ඉහත අංක දරණ පැමිණිල්ල මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ගොනුකර ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580/81/82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2505575 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

පැවති ඇබෑර්තු පිරවීමට අදාළව අයදුම්පත් කැඳවීමේදී අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් මෙන්ම බාහිර අයදුම්කරුවන් හට අයදුම්පත් ඉදිරිපත් කිරීමට අවස්ථා ලබාදී තිබුණද, ඒ පිළිබඳව නිසි පරිදි දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් ආයතනය තුළ නොතිබීමෙන් ද, අයදුම්පත් ඉදිරිපත් කළ පසු ඒවා සලකා බලා ලකුණු ලබාදීමේදී කරන ලද නොසලකා හැරීම් සම්බන්ධයෙන් ද පැමිණිල්ලෙන් කරුණු ඉදිරිපත් කර ඇත. සුදුසුකම් ඇති අය බඳවා ගැනීම වෙනුවට සුදුසුකම් නොමැති අය බඳවා ගැනීම වගඋත්තරකරුවන් විසින් සිදුකර ඇති බවද, එතෙක් සේවය කරමින් සිටින අයගේ දරුවන් සඳහා මාපිය තිළිණ ක්‍රමය යටතේ යම් තනතුරු සංඛ්‍යාවක් ඇබෑර්තු පිරවීමේදී සලකා බැලීම ආයතනය විසින් දීර්ඝ කාලීනව පවත්වාගෙන එන ලද ක්‍රමයක් ලෙස තිබියදී ඊට අදාළව ලකුණු ලබාදීම හෝ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම, අයදුම්කරුවන් තෝරා ගැනීමේදී ක්‍රමවත් පිළිවෙලකට කටයුතු නොකිරීම හා වගඋත්තරකරුවන් පැමිණිලිකරුගේ පුත්‍රයාගේ අයදුම්පත නොසලකා හරිමින් කටයුතු කිරීමෙන් තම දරුවාට හිමි රැකියාව ලබාගැනීමට ඇති අවස්ථාව අහිමි කර ඇති බව පෙත්සමෙන් දක්වා ඇත.

## වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

වගඋත්තරකරුවන් විසින් 2016.06.06 දිනැතිව තම කරුණු ඉදිරිපත් කර ඇති අතර, එයට අනුව පැවති පුරප්පාඩු කඩිනමින් පිරවීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව 2016.02.12 දින සිට 2016.02.29 දින දක්වා මානව සම්පත් කළමණාකරණ අංශයේදී සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ බවද, මාපිය තිළිණ ක්‍රමය යටතේ යම් තනතුරු සංඛ්‍යාවක් සේවක දූ දරුවන්ට ලබාදීමට අයදුම් කිරීමට ඉඩ ලබාදුන් බවත් වෘත්තීය සමිති වෙත දැනුවත් කිරීම සිදුකර තිබූ බවද දක්වා ඇත. බාහිර අයදුම්කරුවන්ගෙන් ලැබී තිබූ අයදුම්පත් හා සේවක දූ දරුවන්ගේ අයදුම්පත් ද සලකා බලා අයදුම්පත් 235 ක් සම්මුඛ පරීක්ෂණයට භාජනය කර ඉන් 174 දෙනෙකු හට ස්ථිර පත්වීම් ලබාදීම සිදුකළ බවද ඉන් දක්වා ඇත. ස්ථිර පත්වීම් ලබාදෙන ලද්දේ සම්මුඛ පරීක්ෂණයේදී අවශ්‍ය සුදුසුකම් සලකා බලා බැවින් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් සිදුකර නොමැති බව වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම වේ.

## මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු :-

පැමිණිලිකරු විසින් වගඋත්තරකරුවන්ගේ වාර්තාවට එරෙහිව විරෝධතා හා වැඩිමනත් කරුණු දක්වා ලිඛිත දේශනයක් ඉදිරිපත් කර තිබූ අතර, එය ද පරීක්ෂයේදී සලකා බැලීම සඳහා ගන්නා ලද අතර, එහි සඳහන්ව ඇති පරිදි සේවකයින්ගේ බඳවා ගැනීමට පෙර ප්‍රසිද්ධ පුවත්පත් මගින් හෝ යම් මාධ්‍යයක් මගින් ඒ බව දක්වා නොතිබූ බවද, අන්තර්ජාලය මගින් ඒ බව දන්වා තිබූ බව

කියාසිටිය ද. සාමාන්‍ය බඳවා ගැනීමේ ක්‍රමවේදය වගඋත්තරකරුවන් අනුගමනය කර නොමැති බවද දක්වා ඇත.

තවද, වෘත්තිය සමිති දැනුවත් කළ බවට වගඋත්තරකරුවන් කරුණු දක්වා තිබුණ ද ආයතනයේ දැන්වීම් පුවරු තුළ හෝ වෘත්තිය සමිති නායකයින් වෙත ඒ බව ලිඛිතව දන්වා නොතිබූ බව පැමිණිලිකරු පෙන්වා දී ඇත. වගඋත්තරකරුවන් හට එකී කරුණු අසත්‍ය බව කියාපෑමට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වූ බව නිරීක්ෂණය වේ.

සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත්තේ 2016.02.27 දින සිට 29 වන දින දක්වා බවට වගඋත්තරකරුවන් සඳහන් කර තිබුණද, එම දින වලදී සම්මුඛ පරීක්ෂණ පවත්නා තිබූ බව පැමිණිලිකරුට දැන ගන්නට ලැබී නොමැති බව දන්වා ඇත. තවද පුහුණුවන ගිණිහට තනතුර සඳහා තිබිය යුතු මූලික සුදුසුකම් හෝ සපුරා නොමැති අය තෝරා පත් කර ගැනීම් කළ බවත්, ඒ සඳහා සාක්ෂි ලෙස සේවක අර්ථ සාධක අංක : 17250, 17272 සහ 17297 යටතේ බඳවා ගන්නා ලද බව දක්වා ඇත.

සම්මුඛ පරීක්ෂණයට සහභාගි වූවායැයි කියන පුද්ගලයින් හට එකී දිනවල ආයතනයට ඇතුළුවීම සඳහා ප්‍රධාන ඇතුළුවීමේ දොරටුවෙන් අවසර පත් නිකුත් කළ බවට සඳහන්වී නොමැති බව තමා දන්නා බවද, ඒ සම්බන්ධයෙන් තමා සොයා බැලූ බවද පැමිණිලිකරු ප්‍රකාශ කරන අතර, ඒ අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා පුද්ගලයින් කැඳවූ බවට කරුණු වගඋත්තරකරුවන්ට ඉදිරිපත් කළ නොහැකි බවද හිතවත් අයට සහය ලබාදීමේ චේතනාවෙන් තනතුරු ලබාදී ඇති බවද පැමිණිලිකරු තම ලිඛිත දේශනයෙන් කරුණු දක්වා ඇත.

වසර 36 කට වැඩි කාලයක් ජාතික බණිජ තෙල් සංස්ථාවේ සේවක සංගමයේ සාමාජිකයෙකු වන පැමිණිලිකරුට මාපිය තිළිණ ක්‍රමය යටතේ දූ දරුවන් බඳවා ගැනීමට අවස්ථාවක් ලබාදීම සම්බන්ධව දැනුවත් වීමක් නොලැබී ඇති බව ද, එවැනි දැනුම්දීමක් තිබුනේ නම් එම සංගමයේ සාමාජිකයෙක් ලෙස තමා එය නොදැන සිටීමේ හේතුවක් නොමැති බවද පෙන්වා දී ඇත.

මෙම බඳවා ගැනීම් දැනුම්දීමකින් තොරව සිදුකර ඇති බව පැමිණිලිකරුගේ අදහස වන අතර, සේවකයින් අතර මේ පිළිබඳව ඇති වූ විරෝධතාවයන් මත තම දරුවාට සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීමට ඇති අවස්ථාව වගඋත්තරකරුවන් විසින් අහිමි කළ බව පැමිණිලිකරු සඳහන් කර ඇත.

2017.06.01 දින සම්මුඛ පරීක්ෂණයේදී වගඋත්තරකරුවන් හට පැමිණිලිකරුගේ ඉල්ලීම සම්බන්ධව යම් සමථයක් පාර්ශවයන් අතර තිබේ නම් ඉදිරිපත් කරන ලෙස දන්වා සිටියද, සහනය සඳහා සමථයක් ඉදිරිපත් වී නොමැත.

මේ අනුව විසඳිය යුතු කාරණාව වන්නේ පැමිණිලිකරුගේ දරුවා වන රවින්ද්‍ර රොද්‍රිගෝ යන අය හට මාපිය තිළිණ ක්‍රමය යටතේ සේවක දූ දරුවන් හට තනතුරු සඳහා අයදුම් කිරීමට ලබාදෙන ලද ඇබෑර්තු වලින් යම් ප්‍රතිශතයක් ඒ සඳහා වෙන් කිරීමේ ක්‍රමය යටතේ අයදුම් කිරීමට හැකියාවක් තිබේද යන්න හා එසේ අයදුම් කිරීමට හැකියාවක් තිබේ නම් ඊට අදාළ සුදුසුකම් ඔහු විසින් සපුරා තිබියදී ඔහුට හිමි විය යුතු තනතුර වගඋත්තරකරුවන් විසින් අහිමි කර තිබේද යන්න පිළිබඳව සොයා බැලිය යුතු වීමය.

වගඋත්තරකාර ආයතනය සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති රජය සතු සමාගමක් බව අනාවරණය වන අතර, ආයතනයේ බඳවා ගැනීමේ පටිපාටියක් ඇති බවද අනාවරණය වේ. C4 ශ්‍රේණිය සහ වෙනත් ශ්‍රේණි කිහිපයක් සඳහා බඳවා ගැනීමේ ක්‍රමය වී ඇත්තේ ආයතනය වෙත ලැබෙන අයදුම්පත් සලකා බලා බඳවා ගැනීම බව වගඋත්තරකරුවන් විසින් දක්වා ඇත. පැමිණිලිකරු සඳහන් කර සිටින තනතුර වන ගිණිහට තනතුර අදාළ වන්නේ C4 කාණ්ඩයට බව ද එය තාක්ෂණික ගණයේ තනතුරක් නොවන බවද, වසරක පමණ පුහුණුවකින් පසු C3 ශ්‍රේණියට පත් කරන්නේ සම්මුඛ පරීක්ෂණයකින් පසුව බව ද වගඋත්තරකරවන් වැඩිදුරටත් දන්වා ඇත.

බඳවා ගැනීමේ පටිපාටියට බාහිරව පවතින තනතුරු සඳහා බඳවා ගැනීමේදී ආයතනයට ලැබෙන අයදුම්පත් හැර එකී සම්මුඛ පරීක්ෂණ වල දී සලකා බලනු ලබන වෙනත් සලකා බැලීම් හෝ වෙනත් තැනැත්තන් හෝ ආයතන විසින් ඉදිරිපත් කරන පුද්ගලයින් සිටිද යන්න පිළිබඳව පරීක්ෂණ අවස්ථාවේදී විමසා සිටියදී වගඋත්තරකරුවන් සඳහන් කර ඇත්තේ, ලංකා ඛනිජ තෙල් අමාත්‍යංශය විසින් යොමු කරන පුද්ගලයින්ගේ අයදුම්පත් ද, සේවක සංගම් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ද එහිදී සලකා බලනු ලබන බවයි.

තවද, නිදහස් සේවක සංගමය විසින් අයදුම්කරුවන් 15 දෙනකුගේ නම් ඇතුලත් ලේඛනයක් ඉදිරිපත් කර ඇති බව ද, ඛනිජ තෙල් සංස්ථාව විසින් සලකා බැලිය යුතු බවට ඉදිරිපත් කරන ලද ලේඛනයක් තිබී ඇති බවද ගොනුව පරීක්ෂා කිරීමේදී පෙනියන අතර, වගඋත්තරකරුවන් දක්වා සිටින්නේ එවැනි අයදුම්පත් සම්මුඛ පරීක්ෂණ වලදී සලකා බැලීමට ලැබී ඇති අතර, මාපිය තිළිණ ක්‍රමය යටතේ බඳවා ගැනීම ඇබෑර්තු වලින් ප්‍රතිශතයක් සඳහා වෙන් කර තිබූ බවද වේ.

**නිරීක්ෂණ හා නිගමන :-**

ඛනිජ තෙල් අමාත්‍යංශයේ අමාත්‍යවරුන් ලෙස වරින්වර පත්වූ අමාත්‍යවරුන් විසින් තම අත්සනින් යුතුව ඉදිරිපත් කළ ලිපි මගින් ද, විවිධ සේවක සංගම් වන ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය හා ජාතික සේවක සංගමය වැනි ආයතනයේ වෘත්තිය සමිති විසින් ද, ඉහත කී තනතුරු සඳහා

අයදුම්පත් කැඳවීමේදී ඒට අදාලව සලකා බැලිය යුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් හෝ නම් ලැයිස්තු ලබාදී ඇති බව වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කල කරුණු අනුව අනාවරණය වේ.

ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය විසින් 2016.03.04 දින වගඋත්තරකාර ආයතනයේ සභාපති වෙත නම් 15 ක තොරතුරු ඇතුලත් ලිපියක්. පවතින ඇබෑර්තු පිරවීමේදී සලකා බැලීම සඳහා ඉදිරිපත් කර ඇති අතර. එම අයදුම්පත් සලකා බලා පත්වීම් ලබාදීමේදී මාපිය තිළිණ ක්‍රමය යටතේ බඳවා ගැනීමට වෙන් කල ඇබෑර්තු වලට අදාල ප්‍රතිශතය සහිත පත්වීම් සංඛ්‍යාව තුලින්ම ලබාදී ඇති බවද නිරීක්ෂණය වේ. ජාතික සේවක සංගමය විසින් නම් 37 ක් ඇතුලත් නාම ලේඛනයක් ලබාදී ඇති අතර. සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමේදී නිදහස් සේවක සංගමයේ නම් ලැයිස්තුවේ සඳහන් 15 දෙනා සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවා ඇතත්. ජාතික සේවක සංගමයේ නම් ලැයිස්තුවේ සඳහන් 37 දෙනාගෙන් 15 දෙනෙකු පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඉතිරි පිරිස නොසලකා හැර ඇති බවද නිරීක්ෂණය වේ. එමගින් පෙත්සම්කරුගේ දරුවා වන රවින්ද්‍ර රොද්‍රිගෝ යන අය හට තම සුදුසුකම් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ ඉදිරිපත් කර තමාට පත්වීම් ලබාගැනීමට ඇති අවස්ථාව වගඋත්තරකරුවන් විසින් අහිමි කර ඇති බව නිරීක්ෂණය වන අතර. පැමිණිලිකරුගේ කරුණු දැක්වීමේදී පැමිණිලිකරුගේ දරුවාට වඩා සුදුසුකම් අඩු හෝ එකී තනතුර සඳහා මූලික සුදුසුකම් හෝ නොමැති අය බඳවා ගෙන ඇති බව කරුණු සහිතව පෙන්වා දී තිබියදී වගඋත්තරකරුවන් පරීක්ෂණ අවස්ථාවේදී කිසිදු විරෝධතාවයක් දක්වා නොමැත.

මාපිය තිළිණ ක්‍රමය යටතේ හෝ පියපුතු පදනම යටතේ සේවක දූ දරුවන්ට අවස්ථාවක් ලබාදීමට ඇබෑර්තු පිරවීමේදී ලබාදෙන ලද ක්‍රමවේදය වගඋත්තරකාර ආයතනය විසින් කලින් කලට පවත්වාගෙන ආ එකක් බව ද, එය විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා ලෙස කටයුතු කල සුසිල් ප්‍රේම් ජයන්ත මහතාගේ දැනුම්දීමකට අනුව ආරම්භ කර ඇති බවද දක්වා ඇති අතර. ඒ බව තහවුරු කිරීමට එම අමාත්‍යවරයා විසින් අත්සන් තබා ඉදිරිපත් කරන ලද ලේඛනයක පිටපතක් පැමිණිකරු මෙම පැමිණිලි ගොනුවට ලබාදී ඇත. 2015.11.16 දින අමාත්‍යවරයා විසින් ඒ බව තහවුරු කරමින් සමස්ත ලංකා තෙල් කම්කරු සමිතියේ සභාපති වෙත ලිඛිතව දන්වා තිබී ඇත්තේ අදාල පුරප්පාඩු වලින් 10% ප්‍රමාණයක් සේවක දූ දරුවන් බඳවා ගැනීමේ ක්‍රමවේදය යටතේ බඳවා ගත යුතු බවට අමාත්‍යංශය විසින් ගන්නා ලද එම තීරණය වගඋත්තරකාර ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය වෙත දන්වා ඇති බවයි.

ජාතික සේවක සංගමය විසින් සේවක දූ දරු ක්‍රමය යටතේ බඳවා ගැනීමේදී සලකා බැලිය යුතු අයදුම්පත් ලෙස නම් කල ලැයිස්තුවේ පැමිණිලිකරුගේ දරුවාගේ නම ඇතුලත් වූවද, සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත්වීමට අවස්ථාවක් වගඋත්තරකරුවන් විසින් ලබානොදීමෙන් එම

තනතුරට පැමිණිලිකරුගේ දරුවාට ඇති සුදුසුකම් ඉදිරිපත් කිරීමට ඇති අවස්ථාව වළක්වා හෝ නොලසකා හරිමින් කටයුතු කර ඇති බව මේ අනුව අනාවරණය වේ.

වගඋත්තරකරුවන් විසින් තෝරා ගත් පිරිසක් පමණක් සම්මුඛ පරීක්ෂණ වලට කැඳවා ඇති අතර. එකී තෝරාගත් පිරිස අතර බඳවා ගැනීමේදී සලකා බැලිය යුතු මූලික සුදුසුකම් හෝ නොමැති අයද සිටින බව පැමිණිලිකරු විසින් කරන ලද කරුණු තහවුරු කිරීම් අනුව පෙනීයන අතර. ඒවා අසත්‍ය බවට වගඋත්තරකරුවන් විසින් කරුණු දක්වා නොමැති බව ද නිරීක්ෂණය වේ.

වගඋත්තරකරවැන් විසින් තම විධායක බලතල හා පරිපාලන තීරණ ගැනීමේදී පෙත්සම්කරුගේ දරුවාගේ අයදුම්පත පිළිබඳව නොසලකා හැර කටයුතු කර ඇති බවද. එකී විධායක හා පරිපාලන ක්‍රියාවක් මගින් සිදුකළ නොසලකා හැරීම මත පැමිණිලිකරුගේ දරුවාට 1978 නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත කර ඇති මූලික අයිතිවාසිකම උල්ලංඝනය වීමකට ලක්වී ඇති බවද කොමිෂන් සභාව විසින් මෙම පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

01. ඒ අනුව වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුගේ දරුවාගේ මූලික අයිතිවාසිකම් කඩවන පරිදි කරන ලද ක්‍රියාව තුලින් පැමිණිලිකරුගේ දරුවා වන රවින්ද්‍ර රොද්‍රිගෝ යන අයට තවදුරටත් පැමිණිලිකරු ඉල්ලා සිටින සහනය ලබාගැනීමට ඇති අවස්ථාව සඳහා අයිතිවාසිකමක් ඇති බවටද.

02. ඒ අනුව ගිණිහට තනතුර සඳහා රවින්ද්‍ර රොද්‍රිගෝ යන අය විසින් සුදුසුකම් සපුරා ඉදිරිපත් කරන ලද අයදුම්පත් නොසලකා හරිමින් කටයුතු කර තිබීම පිළිබඳව සලකා බලා එකී සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ දින සිට පැමිණිලිකරුගේ දරුවා වන රවින්ද්‍ර රොද්‍රිගෝ යන අය හට එකී තනතුර හිමි බවට සලකා කටයුතු කළ යුතු බවටද. සම්මුඛ පරීක්ෂණ පැවති අවස්ථාවේ ආයතනය විසින් සලකා බලන ලද සුදුසුකම් රවින්ද්‍ර රොද්‍රිගෝ යන අය වෙත තිබේද යන්න පිළිබඳව පරීක්ෂා කර එම තනතුර සඳහා වූ සුදුසුකම් පවතින්නේ නම් එකී සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ දින සිට බලාත්මක වන පරිදි ලබාදිය යුතු බවටද මෙයින් නිර්දේශ කරනු ලැබේ.

03. තවද මෙවැනි අවස්ථාවන් නැවත උද්ගත වීම වැළැක්වීම සඳහා සියළුම තනතුරු හා සේවක සංඛ්‍යාවද බඳවා ගැනීමේ පටිපාටිද නිසි පරිදි අනුමත කර ගත යුතු බවට හා අවිධිමත් ආකාරයකට පත්වීම් ලබාදීමක් තවදුරටත් සිදු නොකළ යුතු බවටත්. විනිවිදභාවයකින්

යුතුව කටයුතු කළ හැකි පරිදි ආයතනයට අදාලව බඳවා ගැනීම් සිදුකිරීමේදී බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලවම පමණක් බඳවා ගැනීම් සිදුකළ යුතු බවටත් නිර්දේශ කරනු ලැබේ.

2019.০৫.২৪ වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම, නොවීම හෝ වර්තමාන තත්වය සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම් සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොලබන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- ගරු අමාත්‍යතුමා,
බණිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 80, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 07.

B/R-2